ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

# පුවත්පත් නිවේදනය

## <u>ඉන්දියාව දැනට ක්‍රියාත්මක ප්‍රදාන ව්‍යාපෘතීන් සඳහා අමතර අරමුදල් ලබා දේ</u>

ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මහතා සහ නාගරික සංවර්ධන සහ නිවාස අමාත්‍යාංශයේ ලේකම් ඩබ්. එස්. සත්‍යානන්ද මහතා අනුරාධපුර, සෝභිත හිමි ගම්මානයේ නිවාස සහ යටිතල පහසුකම් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රුපියල් මිලියන 150ක අමතර ප්‍රදානයක් ලබාදීම සඳහා ඉන්දීය රජයේ තීරණය නිල වශයෙන් ස්ථාපනය කරමින් ඒ සඳහා වන රාජ්‍යතාන්ත්‍රික ලිපි 2024 මාර්තු 21 වන දින අත්සන් තැබීම සහ හුවමාරු කරගැනීම සිදු කළහ. මේ සමඟ ව්‍යාපෘතිය සඳහා ඉන්දීය රජයේ සමස්ත කැපවීම ශ්‍රී ලංකා රුපියල් මිලියන 450ක් වේ.

2. අමතර ප්‍රදානය ලබාදීමට නිල වශයෙන් සහතික වීමත් සමඟ ඉන්දීය රජයේ ප්‍රදාන යටතේ නිවාස 90ක් ගම්මානය තුළ ඉදිකෙරෙනු ඇත. මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක කරමින් පවතින අතර යෝජිත නිවාස අවසන් කිරීමේ විවිධ අදියරයන්හි පවතී. මෙම ව්‍යාපෘතිය පූජ්‍ය මාදුළුවාවේ සෝභිත හිමි අනුස්මරණ පදනම සමඟ එක්ව ක්‍රියාවට නැංවේ.

3. ශ්‍රී ලංකා ආර්ථිකයේ වෙනස්කම්වලට ප්‍රතිචාර දක්වමින් ඉන්දියානු රජය දැනට ක්‍රියාත්මක ප්‍රදාන ව්‍යාපෘතීන් නවයක මුල් වපසරිය මත ඉදිකිරීම් ද්‍රව්‍යවල පිරිවැය තියුණු ලෙස ඉහළ නැගීමේ බලපෑම අවම කරන අතරතුර ඒවා කඩිනමින් අවසන් කිරීමේ අරමුණින් අමතර අරමුදල් ලබාදීමට තීරණය කළේය. මෙම ව්‍යාපෘතීන් නවය සඳහා ඉන්දීය රජය විසින් ලබාදෙන අමතර අරමුදල් ප්‍රමාණය එක් එක් ව්‍යාපෘතිය සඳහා ඉන්දීය රජය විසින් මුලදී ලබාදීමට එකඟ වූ අරමුදල් ප්‍රමාණය දක්වා 50%කි.

***

**කොළඹ**
**2024 මාර්තු 21**